**ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 02 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,231.00 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,216.74 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 14.26 ක් හෙවත් සියයට 1.16 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,132.00 | 1,118.42 | 13.58 | 1.20 |
| මූලධන | 99.00 | 98.32 | 0.68 | 0.69 |
| **එකතුව** | **1,231.00** | **1,216.74** | **14.26** | **1.16** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 21 ක් හා දෙපාර්තමේන්තු 15 ක් විසින් එකතුව රු.මිලියන 1,530.10 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු.මිලියන 1,440.72 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 89.38 ක් හෙවත් සියයට 5.8 ක් ඉතිරි කර තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 70.00 | 66.77 | 50.00 | 63.57 | 240.00 | 196.14 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන තැන්පතු ගිණුම් 06ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 857.73 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0044/000 | 0.29 |
| 6000/0000/00/0002/0059/000 | 1.91 |
| 6000/0000/00/0013/0025/000 | 35.94 |
| 6000/0000/00/0016/0006/000 | 679.02 |
| 6000/0000/00/0017/0001/000 | 137.51 |
| 6000/0000/00/0018/0007/000 | 3.06 |
| **එකතුව** | **857.73** |

## 2.4 විගණන නිරීක්ෂණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 විගණන සාක්ෂි නොවීම**

ගහවට කොරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නඩත්තු කාලය අවසන් ව්‍යාපෘතීන් 05කට අදාළ ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.1,050,000 කට අදාළ ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18 ක සිට සියයට 36 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2.2 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන**

දෙල්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් 2016 ජුනි 06 දින කරන ලද නියැදි විගණන පරික්ෂාවේදී ව්‍යාපෘති 5ක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම් කටයුතුවල අවුරුදු 03 ක සිට අවුරුදු 21 ක් දක්වා කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 1.56 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 6 ක සිට වර්ෂ 13 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත්වී තිබුණි.

**3.4 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි (5) 386 | 427, 452 | ගහවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය කොන්ත්‍රාත්කරුවන් සඳහා ලියන ලද අත්සන් රහිත චෙක්පත් දෙකක වටිනාකම ගෙවීම් ලෙස මුදල් |

| | | | |
|---|---|---|---|
| | | | පොතට ඇතුළත් කර විගණන දිනය වූ 2017 ජනවාරි 06 දින වන විටත් සංවර්ධන අංශයේ රඳවා ගෙන තිබුණි. |
| **(ආ)** | **ප්‍රාදේශිය ලේකම් කාර්යාල සේවා මාර්ගෝපදේශ සංග්‍රහය** | | |
| | 11.4(iv) මාර්ගෝපදේශය | 27,633 | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික සඳහා දේපළවල වටිනාකමෙන් සියයට 1.15 ක බලපත්‍ර ගාස්තුවක් අය කළ යුතු බව දක්වා තිබුණත්, මහනුවර කඩවත්සතර හා ගඟවට කෝරලයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014, 2015 හා 2016 වර්ෂවල වටිනාකම් සහතික නිකුත් කිරීමේදී වටිනාකමෙන් සියයට 1 ක් පමණක් අයකර ගෙන තිබුණු බැවින් එකතුව රු.27,633 ක ආදායම් රජයට අහිමි වී තිබුණි. |

## 3.5 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|
| | | රු. | |
| හතරලියද්ද | හතරලියද්ද කුඩා ඔය හරහා පාලම මාර්ගය සංවර්ධනය කිරීම - 2016 | 300,000 | ඉඩම් හිමියාගේ දැඩි විරෝධය |
| යටිනුවර | බත්ගොඩ සමගි මාවත සංවර්ධනය කිරීම | 350,000 | යටිනුවර ප්‍රාදේශීය සභාව මගින් කරන ලද මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පෞද්ගලික ඉඩම් හිමියන්ගේ ගැටළුවක් පැවතීම. |

| | | | |
|---|---|---|---|
| | අටලතහේන මාර්ගය සංවර්ධනය කිරීම | 300,000 | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම |
| | | ----------- | |
| **එකතුව** | | **950,000** | |
| | | ====== | |

**(ආ) රඳවා ගන්නා මුදල් සඳහන් කිරීම**

අවසන් කර තිබුණු කොන්ත්‍රාත්වලින් රඳවාගන්නා ලද මුදල ගෙවීම් කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ තාක්ෂණික නිලධාරී වාර්තාවක් ලබාගත යුතු වුවද, ගඟවට කොරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේ ව්‍යාපෘති 02 ක් හා 2015 වර්ෂයේදී ව්‍යාපෘති 13ක වැඩ අවසන් කර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට පිළිවෙලින් මාස 2ක් හා මාස 12 ක් ගතවී තිබුණත්, තාක්ෂණික නිලධාරී වාර්තාවන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.6 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් ව්‍යාපෘතියක වැඩ අවසන් කළ බව 2016 දෙසැම්බර් 31 දින කොන්ත්‍රාත්කරු විසින් දන්වා තිබූ අතර, එම ව්‍යාපෘතියේ අවසන් බිල්පතට සැලැසුම් ශිල්පී, තාක්ෂණික නිලධාරී හා ප්‍රාදේශිය ලේකම් විසින් දින රහිතව අත්සන් කර තිබුණි. තවද, ඒ සඳහා රු.175,229 ක් 2016 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ශ්‍රවනාගාරයක් සහිත තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) අදාළ ව්‍යාපෘතිය නියමිත දිනට නිම කර භාර නොදීම හේතුවෙන් රු.10,899,274 ක ප්‍රමාද ගාස්තුවක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි.

(ii) අධීක්ෂණ ආයතනය මගින් ලබාදිය යුතු සැලැසුම් නියමිත දිනට ලබා නොදීම හේතුවෙන් අසාමාන්‍ය ලෙස කොන්ත්‍රාත්තුවේ කාලය දිර්ඝ වීම හේතුවෙන් වූ මිල විචලනය සඳහා රු.5,124,161 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(iii) නිසි උපදේශන සේවාවක් ලබා නොදීම හා නිසි වේලාවන්හී අදාළ සැලැසුම් ඉදිරිපත් නොකිරීම ආදී දෝෂයන් තිබියදී උපදේශක සේවාවන් සැපයීම වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු.6,614,701 ක් 2016 ජුලි 15 දින ගෙවා තිබුණි.

**(ඇ)** මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ශ්‍රවනාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ විදුලි ජනක යන්ත්‍රයක් සපයා සවි කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ලංසු විවෘත කළ දිනයේ සිට පිළිවෙලින් මාස 4 ක් හා මාසයක් ලෙස අසාමාන්‍ය ලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද කර තිබුණි.

(ii) ප්‍රසම්පාදන සැලැස්මකට හා ප්‍රසම්පාදන කාලසටහනකට අනුව යන්ත්‍ර සපයා සවිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) ලංසුකරු ගිවිසුම්වලට එළඹීමට කටයුතු නොකිරීම නිසා ලංසු ආරාධනයේ සිට ලංසු ප්‍රදානය දක්වා රු.21,229 ක නිෂ්කාර්ය වියදම් සිදු කර තිබුණි.

(ඇ) මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ශ්‍රවණාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වායු සමීකරණ පද්ධතිය සවි කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ලංසු විවෘත කිරීමට නියමිත දිනයේදී විවෘත කිරීමෙන් තොරව වෙනත් දිනයකදී, ලංසුකරුවන්ට ආරාධනා නොකර විවෘත කර තිබුණි.

(ii) ලංසු විවෘත කර, ප්‍රදානය කිරීම දක්වා කාල ප්‍රමාදයක් පැවතුණි.

(iii) තෝරාගත් ලංසුකරුට ලංසුව ප්‍රදානය කළද, ඔහු නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීමට කටයුතු නොකළ ද, ලංසුකරුට විරුද්ධව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(iv) ගිවිසුමකට එළඹීමට කටයුතු නොකිරීම නිසා ලංසුකරු තබා තිබූ රු.350,000 ක ලංසු සුරක්ෂණය රාජසන්තක කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) ජයග්‍රාහී කොන්ත්‍රාත්කරු වශයෙන් තෝරාගත් ලංසුකරු නිත්‍යානුකූල ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබියදී 2015 වර්ෂයේ කැඳවන ලද ලංසු පත් 2016 වර්ෂය දක්වා වලංගු කර කොන්ත්‍රාත්තුව අත්සන් නොකර විශ්වාසය කඩකළ පුද්ගලයන්ට නැවත කොන්ත්‍රාත්තුව පවරා තිබුණි.

(vi) ප්‍රමාද ගාස්තු වශයෙන් රු.128,780 ක් අයකර නොතිබුණි.

**3.7 පාඩු හා හානි**

**--------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක වාහන 08 කට සිදුවී තිබූ අනතුරුවලින් රු.3,420,125 ක අලාභයක් සිදුවී වර්ෂ 2 ක සිට වර්ෂ 16 ක් අතර කාල පරාසයක් ගතවී තිබුණද, එම අලාභයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.8 කළමනාකරණ දුර්වලතා**

**--------------------------**

බාල වයස්කාර දරුවන්ගේ වයස් සම්පූර්ණවීමෙන් පසුව ඉතිරි කිරීමේ ගිණුම් නිදහස් කළ යුතු වුවද, විගණන පරීක්ෂාව සිදු කළ 2016 නොවැම්බර් 19 දින වන විටත් වයස අවුරුදු 18 මාස 5 ක් හා අවුරුදු 33 මාස 2 ක් අතර වයස කාල පරාසයක් වයස සම්පූර්ණ වූ බාල වයස්කරුවන් 8 දෙනෙකුගේ ඉතිරි කිරීමේ ගිණුම් උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේප්පුවේ රඳවාගෙන තිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 82 | 78 | 4 | - |
| (ii) | තෘතියික මට්ටම | 48 | 40 | 12 | 4 |
| (iii) | ද්විතියික මට්ටම | 3,362 | 3,098 | 264 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 206 | 160 | 46 | - |
| | එකතුව | 3,698 | 3,376 | 326 | 4 |